# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2185/40 - 2020 ජූලි මස 21 වැනි අඟහරුවාදා - 2020.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : NYGM/LAN/7/53.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/172.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තර වලල්ලාවිට කෝරළය දකුණ-නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 30බී, උතුරු පිටිගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අ.ග.පි 592 අතිරේක අංක 28 පත්‍ර අංක 29 ඉ.වි.ලැ. පිටු අංක 154 හි දක්වා ඇති පහත විස්තර වන ඉඩම් කැබැල්ල සම්බන්ධයෙනි.

**කැබලි අංකය 1033**

ඉඩමේ නම: හල්ගහඕවිට; වර්තමාන ඉඩම් පරිහරණය: රජය; හිමිකම් කියනාගේ නම හා ලිපිනය: ආර්. ඒ. කරුණාරත්න මයා, ඩබ්. ඩී. එම්. ප්‍රදීප් කුමාර මයා, අංක 235, තොටුපල පාර, පිටිගල; ප්‍රමාණය: හෙක්. 0.0101.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.10.14 වැනි දින පෙ.ව. 10.30 ට නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020.10.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
නියාගම.

2020 ජනවාරි මස 31 වන දින,
නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-72

1A - G 32554 - 22 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.